පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය
நிருவாகத்துக்கான பாராளுமன்றஆணையாளர் அலுவலகம் (ஒம்புட்ஸ்மன்)
OFFICE OF THE PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION
(Ombudsman)

පළමු මහල, අංක:14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ 04.
முதலாவது மாடி, இல -14 ஆர்.ஏ.டி மெல் மாவத்தை, கொழும்பு - 04.
First Floor, No: 14 R.A.De Mel Mawatha, Colombo 04, Sri Lanka.

කොමසාරිස් / ஆணையாளர் / Commissioner 011-2588982
පරිපාලන නිලධාරී / நிருவாக உத்தியாகத்தர் / Administrative Officer 011-2585896
කාර්යාලය / அலுவலகம் / Office 011-2588798
ෆැක්ස් / பக்ஸ் / Fax 011-2501126
E-mail: ombudssl@sltnet.lk

---

මගේ අංකය: / எனதுஇல: / My No:

ඔබේ අංකය: / உமது இல: / Your No:

දිනය: / திகதி: / Date

## පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් නිල වෙබ් අඩවිය එළි දක්වන මෙම අවස්ථාවේදී වචන කිහිපයක් සටහන් කරන්නට ලැබීම, මට මහත් සතුටක් ගෙන දෙන කරුණකි. මෙම ආයතනය වසර 35 කට පෙර ආරම්භ කළ මොහොතේ පටන්, සිවිල් සමාජය වෙත විශිෂ්ට සේවාවක් ලබා දී ඇත. බොහෝ විට මෙම වගකීම් ඉටුකිරීම බරපතල සම්පත් ඌණතා මධ්‍යයෙහි සිදු කර ඇත. මෙම වෙබ් අඩවිය ආරම්භ කිරීම ආයතනයේ ඉතිහාසයට එක්වන දැවැන්ත පියවරක් පමණක් නොව, එමඟින් ශ්‍රී ලාංකීය පුරවැසියනට ආයතනය වෙත ළඟා වීම වඩාත් පහසු වනු ඇත.

යහපාලනය නූතන සමාජයේ මූලික අවශ්‍යතාවකි. සමස්තයක් වශයෙන් ජනතාවගේ පරම යහපත උදෙසා පරිපාලන කටයුතු දුෂ්කරතාවකින් තොරව සිදුකර ගෙන යාමේ වගකීම පැවරී ඇති රජයේ යාන්ත්‍රණවලට එදිනෙදා පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම සඳහා පුළුල් බලතල පැවරී ඇත. නීති, රෙගුලාසි, ස්වාභාවික යුක්තිය හා සාධාරණත්වය උල්ලංඝනය කිරීම සඳහා එම බලතල භාවිත කළ හැකි බවක් මින් අදහස් නොවේ. අයථා පරිපාලනය තුළින් පුද්ගලයකුට යම් අයුක්තියක් සිදු වී තිබෙනම් එකී අයුක්තියට හේතු සෙවීම, විමර්ශනය කිරීම, සහනයක් ලබා දීම හා එය නිවැරදි කිරීම සඳහා ඔම්බුඩ්ස්මන් කාර්යාලය පිහිටුවා ඇත.

ඔම්බුඩ්ස්මන් විසින් ප්‍රබල, උද්දච්ච සමහර නිලධාරීන් සහ ඔවුන්ගේ පීඩාකාරී ක්‍රියා පටිපාටීන්, මහජනයා පිළිබඳව ඇති නොසැලකිල්ල, සහ රජ්‍ය පරිපාලනය සම්බන්ධ ඒකාධිකාරී ස්වභාවය බැහැර කරයි. කාර්යක්ෂමතාව හැරුණු කොට, තමාට මුහුණපෑමට සිදුවන සියළුම අවස්ථා පිළිබඳව පාලකයා සතුව මානවවාදී ප්‍රවේශයක් තිබිය යුතුය. සේවාව පිළිබඳව ජීවගුණය ඔහු සතුව පැවතිය යුතුය. එවැනි ගුණාංග නොමැතිනම්, කොතරම් ප්‍රශස්ත පුහුණුවක් ලද පරිපාලකයකු වුවද, තමාට නිරාකරණය කිරීමට තිබෙන ගැටළු පිළබඳව නිවැරදි දැක්මක් ඇති කර ගැනීමට අපොහොසත් වනු ඇත. එවැනි අවස්ථා වලදී, මහජනයා විසින් මෙම ආයතනය වැනි සහන සලසා ගත හැකි විකල්ප මාර්ග වෙත යොමු වනු ඇත.

එසේ සඳහන් කරමින් මෙය සමාප්ත කරමි. මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සියළුදෙනා හට මාගේ ස්තුතිය පුද කරමි.

එල්.ඒ.තිස්ස ඒකනායක
පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්
(ඔම්බුඩ්ස්මන්)

---

සැ.යු / க.வே. / N.B
මෙම ලිපියට පිළිතුරු සැපයීමේදී කරුණාකර මගේ යොමු අංකය සඳහන් කරන්න
இக்கடிதத்துக்கு பதில் எழுதும் போது தயவு செய்து எமது இலக்கத்தை குறிப்பிடவும்
Quote my reference in reply